**ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 04 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 192.25 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 176.71 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 15.54 ක් හෙවත් සියයට 8.08 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 179.25 | 169.07 | 10.18 | 5.68 |
| මූලධන | 13.00 | 7.64 | 5.36 | 41.23 |
| **එකතුව** | **192.25** | **176.71** | **15.54** | **8.08** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 31101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු. මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු. මිලියන** |
| 12.48 | 10.17 | 7.68 | 11.91 | 60.00 | 30.52 |

**2.3 විගණන නිරීක්ෂණය**

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 31101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,084,724 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 29 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) හිඟ ණය ශේෂ 10 කට අදාළ එකතුව රු.172,096 ක් වූ ණය සම්බන්ධයෙන් අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම ණය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග හෝ ණය අයකර නොගැනීමට හේතු විගණනයේදී අනාවරණය කර ගැනීමට නොහැකි විය. ලිපිගොනු පිළිබඳ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම ලිපිගොනු සොයා ගත නොහැකි බව විගණනය වෙත දන්වා තිබුණි. මේ අනුව හිඟ ණය ශේෂයන් සහිත ලිපිගොනු අස්ථානගත වීමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු වුවත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ස්ථාන මාරුවී ගිය නිලධාරින් දෙදෙනෙකුගේ එකතුව රු.207,810 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ සිදුකර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

### නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු.මිලියන | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 137 හා 138 | 3.97 | මුදල් රෙගුලාසි 137 හා 138 පටහැනිව කටයුතු කර පරිගණක හා උපාංග නියමිත පරිදි දෙපාර්තමේන්තුව වෙත ලැබීමට පෙර ගෙවීම අනුමත කිරීම හා සහතික කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 139 | 3.97 | මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව අදාළ භාණ්ඩ ලැබූ බව ලේඛන ගත සාක්ෂි අනුව තහවුරු කරගත යුතු වුවත්, එසේ තහවුරු කර ගැනීමකින් තොරව එම භාණ්ඩ ලැබීමට පෙර 2015 දෙසැම්බර් 31 දින චෙක්පත් මගින් ගෙවීම් කර තිබුණි. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 09 | 31 |
| (ii) | තෘතීයික මට්ටම | 08 | 01 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 113 | 72 | 41 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 233 | 206 | 27 |
| | **එකතුව** | **394** | **288** | **106** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු දෙක 2015 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ආ) පුජාභූමි සංවර්ධන කටයුතු සඳහා වෙනම අමාත්‍යාංශයක් තිබියදීත් ස්ථාන 12 ක පැවති පුජාභූමි නඩත්තු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ 165 ක් අනුයුක්ත කර තිබුණි.